# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA

පෙරහැර අංකය :- ......................

ගරු ස්වාමීන්වහන්ස
ප්‍රිය මහත්මයාණෙනි/මහත්මියනි/මෙනෙවියනි

**<u>51 වැනි උපාධි ප්‍රදානෝත්සවය 2025</u> – (2025 ඔක්තෝබර් මස 15, 16 , 17 )**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 51 වැනි උපාධි ප්‍රදානෝත්සවය 2025 ඔක්තෝබර් මස 15, 16, 17 යන දිනවල කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වනු ලැබේ.**

මෙම උපාධි ප්‍රදානෝත්සවය **සැසි 09** කින් යුක්ත වන අතර ඔබට නියමිත සැසිය පහත දැක්වේ.

පළමුවන සැසිය - **<u>2025 ඔක්තෝබර් මස 15 වැනි දින පෙ.ව. 8.00 සිට පෙ.ව. 10.00 දක්වා මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ</u>**

- ශාස්ත්‍රවේදී, ශාස්ත්‍රවේදී ගෞරව, සංස්කෘත - ශාස්ත්‍රවේදී ගෞරව, පාලි - ශාස්ත්‍රවේදී ගෞරව, බෞද්ධ දර්ශනය - ශාස්ත්‍රවේදී ගෞරව, සමාජවිද්‍යාව - ශාස්ත්‍රවේදී ගෞරව, බෞද්ධ ශිෂ්ටාචාරය - ශාස්ත්‍රවේදී ගෞරව, බෞද්ධ උරුමය හා සංචාරක ව්‍යාපාර - ශාස්ත්‍රවේදී ගෞරව, දර්ශනය - ශාස්ත්‍රවේදී ගෞරව, මනෝවිද්‍යාව - ශාස්ත්‍රවේදී ගෞරව, දේශපාලන විද්‍යාව - ශාස්ත්‍රවේදී ගෞරව, සිංහල - ශාස්ත්‍රවේදී ගෞරව, ජනසන්නිවේදනය - ශාස්ත්‍රවේදී ගෞරව, ව්‍යාපාර සංඛ්‍යානය - ශාස්ත්‍රවේදී ගෞරව සහ සමාජ සංඛ්‍යානය - ශාස්ත්‍රවේදී ගෞරව උපාධියට අදාල උපාධිලාභීන් සඳහා

දෙවන සැසිය - **<u>2025 ඔක්තෝබර් මස 15 වැනි දින පෙ.ව. 11.00 සිට ප.ව. 1.00 දක්වා මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ</u>**

- මානව විද්‍යාව - ශාස්ත්‍රවේදී ගෞරව, අපරාධවිද්‍යාව හා අපරාධ යුක්තිය - ශාස්ත්‍රවේදී ගෞරව, ආර්ථිකවිද්‍යාව - ශාස්ත්‍රවේදී ගෞරව, ඉංග්‍රීසි - ශාස්ත්‍රවේදී ගෞරව, ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම - ශාස්ත්‍රවේදී ගෞරව, භූගෝලවිද්‍යාව - ශාස්ත්‍රවේදී ගෞරව, පුරාවිද්‍යාව - ශාස්ත්‍රවේදී ගෞරව, ඉතිහාසය - ශාස්ත්‍රවේදී ගෞරව, නර්තනය හා සංස්කෘතික අධ්‍යයනය - ශාස්ත්‍රවේදී ගෞරව, හින්දි - ශාස්ත්‍රවේදී ගෞරව, සංගීතය - ශාස්ත්‍රවේදී ගෞරව, භූ අවකාශීය තාක්ෂණ - විද්‍යාවේදී ගෞරව සහ තොරතුරු තාක්ෂණ - විද්‍යාවේදී ගෞරව උපාධියට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

තෙවන සැසිය - **<u>2025 ඔක්තෝබර් මස 15 වැනි දින ප.ව. 2.30 සිට ප.ව. 04.30 දක්වා</u>**

- <u>තාක්ෂණ පීඨයේ</u> ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව, ජෛවපද්ධති තාක්ෂණවේදී ගෞරව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා

සිව්වන සැසිය - **<u>2025 ඔක්තෝබර් මස 16 වැනි දින පෙ.ව. 8.00 සිට පෙ.ව. 10.00 දක්වා</u>**

- <u>කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ</u> වාණිජවේදී (විශේෂ) , විද්‍යාවේදී දේපල කළමනාකරණ හා තක්සේරු විද්‍යා (විශේෂ), විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) (විශේෂ), විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණ (විශේෂ) සහ විද්‍යාවේදී මෙහෙයුම් සහ තාක්ෂණ කළමනාකරණ (විශේෂ) උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා

පස්වන සැසිය - **<u>2025 ඔක්තෝබර් මස 16 වැනි දින පෙ.ව. 11.00 සිට ප.ව. 01.00 දක්වා</u>**

- <u>කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ</u> විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ), විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (ව්‍යාපාර ආර්ථික විද්‍යා) (විශේෂ) සහ විද්‍යාවේදී අලෙවි කළමනාකරණ (විශේෂ) උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා

හයවන සැසිය - <u>2025 ඔක්තෝබර් මස 16 වැනි දින ප.ව. 2.30 සිට ප.ව. 04.30 දක්වා</u>

- <u>කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ</u> විද්‍යාවේදී ගණකාධිකරණ (විශේෂ), විද්‍යාවේදී මූල්‍ය (විශේෂ) , විද්‍යාවේදී ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) සහ විද්‍යාවේදී ව්‍යවසායකත්ව (විශේෂ) උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා

හත්වන සැසිය - <u>2025 ඔක්තෝබර් මස 17 වැනි දින පෙ.ව. 8.00 සිට පෙ.ව. 10.00 දක්වා</u>

- <u>ව්‍යවහාරික විද්‍යා පීඨයේ</u> විද්‍යාවේදී (ගෞරව) සහ විද්‍යාවේදී (ගෞරව) ව්‍යවහාරික විද්‍යා උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා

අටවන සැසිය - <u>2025 ඔක්තෝබර් මස 17 වැනි දින පෙ.ව. 11.00 සිට ප.ව. 01.00 දක්වා</u>

- <u>ව්‍යවහාරික විද්‍යා පීඨයේ</u> විද්‍යාවේදී උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා
- <u>නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨයේ</u> විද්‍යාවේදී නාගරික ජෛව සම්පත් උපාධිය සහ විද්‍යාවේදී ජලජ ජෛව සම්පත් උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා

නවවන සැසිය - <u>2025 ඔක්තෝබර් මස 17 වැනි දින ප.ව.02.30 සිට ප.ව.04.30 දක්වා</u>

- <u>ඉංජිනේරු පීඨයේ</u> ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා
- <u>වෛද්‍ය විද්‍යා පීඨයේ</u> වෛද්‍යවේදී සහ ශල්‍යවේදී, විද්‍යාවේදී මානව ජීව විද්‍යා ගෞරව, විද්‍යාවේදී මානව ජීව විද්‍යා, විද්‍යාවේදී හෙද ගෞරව, ඖෂධවේදී ගෞරව සහ විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා ගෞරව උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා
- <u>සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ</u> විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා ගෞරව, විද්‍යාවේදී හෙද ගෞරව සහ ඖෂධවේදී ගෞරව උපාධියට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා

**සැ.යු.:- ඔබ වෙත පිරිනමනු ලබන උපාධි සහතිකයට, උප්පැන්න සහතිකයට අනුව ඔබගේ නම සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන් ඇතුලත් කරනු ලබන්නේ විශ්වවිද්‍යාලයීය ලියාපදිංචි ලේඛනයන්හි හා විශ්වවිද්‍යාලයීය පාලක සභාවෙන් අනුමත අවසන් ප්‍රතිඵල ලේඛනයන්හි සඳහන් ආකාරයට බැවින් කිසිඳු ආකාරයක වෙනසක් සිදු නොකරන බව අවධාරණයෙන් යුතුව දන්වා සිටිමි.**

**1. <u>උපාධිලෝගු සහ ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම:</u>**

**පහත සඳහන් දිනවලදී <u>ඔබට අදාළ පීඨයේදී</u> පෙරවරු 9.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා සහ පස්වරු 1.00 සිට පස්වරු 4.00 දක්වා උපාධිලෝගුව සමඟ හිස්වැස්ම, සාටකය සහ ප්‍රවේශ පත්‍ර ඔබ වෙත නිකුත් කරනු ලැබේ. (නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය සඳහා පෙ.ව. 9.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා පමණි.)**

- <u>මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය</u>

**2025 ඔක්තෝබර් මස 11 සහ ඔක්තෝබර් මස 12**

- <u>තාක්ෂණ පීඨය</u>

**2025 ඔක්තෝබර් මස 11, ඔක්තෝබර් මස 12 සහ ඔක්තෝබර් මස 13**

- <u>කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය</u>

**2025 ඔක්තෝබර් මස 11 සහ ඔක්තෝබර් මස 12**

- <u>ව්‍යවහාරික විද්‍යා පීඨය</u>

**2025 ඔක්තෝබර් මස 11, ඔක්තෝබර් මස 12**

- <u>නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය</u>

**2025 ඔක්තෝබර් මස 13 (පෙ.ව.09.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා පමණි)**

- <u>ඉංජිනේරු පීඨය</u>

**2025 ඔක්තෝබර් මස 11, ඔක්තෝබර් මස 12 සහ ඔක්තෝබර් මස 13**

- <u>වෛද්‍ය විද්‍යා පීඨය</u>

**2025 ඔක්තෝබර් මස 11, ඔක්තෝබර් මස 12**

- <u>සම සෞඛ්‍ය විද්‍යා පීඨය</u>

**2025 ඔක්තෝබර් මස 11**

- උපාධි ලෝගුව, සාටකය සහ හිස්වැස්ම සමඟ උපාධි ප්‍රදානෝත්සවයට අදාළ ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම සඳහා රු.5,000/= තැන්පතු මුදල ගෙවන ලද අදාළ කුවිතාන්සිය (බැංකු රිසිට්පත / මාර්ගගත ගෙවුම් ලදුපත), ශිෂ්‍ය වාර්තා පොත සහ මෙම ලිපිය පීඨ කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. <u>ශිෂ්‍ය හැඳුනුම්පත මෙතෙක් බාරදී නොමැති නම් එය මෙම අවස්ථාවේ දී පීඨ කාර්යාලයට බාර දිය යුතුය</u>.

අදාළ ගෙවීම් සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ ශිෂ්‍ය ගෙවීම් පද්ධතිය වෙත පිවිස එහි ඇති ඔබට අදාළ ගිණුම් අංකය සහිත ආදර්ශ රිසිට් පත බාගත කරගෙන ඕනෑම මහජන බැංකු ශාඛාවකට මුදලින් ගෙවීම් කළ හැකිය. ඊට අමතරව ක්‍රෙඩිට් කාඩ්පත භාවිතයෙන් අන්තර්ජාලය හරහා ද ගෙවීම් කළ හැකිය. එසේ ගෙවීම් කර බාගත කර ගන්නා ලද මුදල් ගෙවීම් කුවිතාන්සිය <u>2025 ඔක්තෝබර් මස 07 දිනට පෙර</u> සූදානම් කරගත යුතුය. ඔබට උපාධිලෝගු ලබා ගැනීමේ දී ඇතිවන අපහසුතා මඟ හරවා ගැනීම සඳහා ඉහත දිනට පෙර ගෙවීම් කරන්න.

පහත සඳහන් ආකාරයට විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිස ගෙවීම් කිරීමට අවශ්‍ය තොරතුරු ලබාගත හැක.

www.sjp.ac.lk ➡ Students ➡ Student Payments ➡ Internal Student ➡ Enter Your NIC Number & Select Faculty ➡ Select **'Refundable Cloak Fee '**

**තවද, විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියේ පලකර ඇති පහත සඳහන් අයදුම්පත සම්පූර්ණ කර <u>උපාධි ලෝගු ලබා ගන්නා අවස්ථාවේ දී පීඨ කාර්යාලය වෙත අනිවාර්යෙන්ම බාර දිය යුතු වේ.</u>**

1. **උපාධි ලෝගු ගාස්තු නැවත ගෙවීමේ අයදුම්පත (ඇමුණුම i)**

**තවද, විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ (<u>https://www.sjp.ac.lk/students/</u>) හි පලකර ඇති උපාධිලාභීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය (Graduate Employability Survey) සඳහා වන ගූගල් ආකෘති පත්‍රය ද (Google Form) අන්තර්ජාලය ඔස්සේ මාර්ගගතව උපාධි ලෝගු නිකුත් කරන දිනයට ප්‍රථම අනිවාර්යෙන්ම සම්පූර්ණ කල යුතුය.**

එලෙසම උපාධි ලෝගුව, හිස්වැස්ම සහ සාටකය භාවිතා කිරීම සඳහා වන ආචාරධර්ම උපාධිලාභියා විසින් අනිවාර්යෙන්ම පිළිපැදිය යුතු වන අතර, එම ආචාරධර්ම විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියේ පල කරනු ලැබේ. එය කියවා හොඳින් තේරුම් ගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

තවද, කිසිදු හේතුවක් නිසා උපාධි ප්‍රදානෝත්සවය පවත්වනු ලබන දින තුළ උපාධි ලෝගු හා හිස්වැසුම් නිකුත් කරනු නොලැබේ. උපාධි ලෝගුව, හිස්වැස්ම නොමැතිව කිසිදු ගිහි උපාධිලාභියකුට උපාධි පෙරහැරට සහභාගී විය නොහැකිය. උපාධිලාභී භික්ෂූන් වහන්සේලා සඳහා චීජිනිපත් එදින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී ලබා ගත හැකිය.

## 2. <u>උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ සාටකය ආපසු බාරදීම:</u>

උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ සාටකය ඔබගේ උපාධි ප්‍රදානෝත්සවය අවසානයේ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පිහිටවනු ලබන විශේෂ කවුන්ටරය වෙත භාර දිය යුතුය. යම් හෙයකින් එලෙස භාරදිය නොහැකි වුවහොත් පහත සඳහන් දිනයන්හි දී පමණක් අදාළ පීඨ කාර්යාලයට පැමිණ උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම

සහ සාටකය භාර දිය හැකි අතර නියමිත දිනට පෙර උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ සාටකය භාරදීමට අපොහොසත් වුවහොත් ප්‍රමාද වන දින අනුව දඩ මුදලක් ගෙවීමට සිදුවනු ඇත.

- <u>මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය</u>

2025 ඔක්තෝබර් 25 / ඔක්තෝබර් 26

- <u>තාක්ෂණ පීඨය</u>

2025 ඔක්තෝබර් 25 / ඔක්තෝබර් 26 / ඔක්තෝබර් 27

- <u>කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය</u>

2025 ඔක්තෝබර් 25 / ඔක්තෝබර් 26

- <u>ව්‍යවහාරික විද්‍යා පීඨය</u>

2025 ඔක්තෝබර් 25 / ඔක්තෝබර් 26

- <u>නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය</u>

2025 ඔක්තෝබර් 27

- <u>ඉංජිනේරු පීඨය</u>

2025 ඔක්තෝබර් 25 / ඔක්තෝබර් 26 / ඔක්තෝබර් 27

- <u>වෛද්‍ය විද්‍යා පීඨය</u>

2025 ඔක්තෝබර් 25 / ඔක්තෝබර් 26

- <u>සම සෞඛ්‍ය විද්‍යා පීඨය</u>

2025 ඔක්තෝබර් 25

උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ සාටකය භාරදෙන අවස්ථාවේ දී උපාධි ලෝගුව සහ හිස්වැස්ම සඳහා ගෙවන ලද රු. 5000/= ක තැන්පත් මුදල ඔබ වෙත මුදලින් ගෙවීමට හෝ ඔබගේ ගිණුම් අංකයට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. මීට අමතරව ඔබ වෙත ලබා දුන් උපාධි ලෝගුව, හිස්වැස්ම සහ සාටකයට කිසියම් අලාභ හානියක් වී ඇත්නම් හෝ එය අස්ථානගත වී ඇත්නම් එහි සම්පූර්ණ වටිනාකම ඔබට ගෙවීමට සිදුවේ.

3. <u>ඇඳුම්:</u>

කාන්තා උපාධිලාභීන් අභිමත වර්ණයක <u>සාරි හෝ ඔසරිවලින්</u> අනිවාර්යෙන්ම සැරසී සිටිය යුතු අතර පිරිමි උපාධිලාභීන් ජාතික ඇඳුමින් හෝ ටයි පටිය සහිත යුරෝපීය ඇඳුමින් සැරසී සිටිය යුතුය.

4. <u>පැමිණීම:</u>

උපාධි ප්‍රදානෝත්සවය ආරම්භ වීමට <u>පැය එක හමාරකට පෙර</u> බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට පැමිණ උපාධිලාභී පෙරහැර සඳහා සූදානම් විය යුතුය.

5. <u>උපාධි පෙරහැරේ පෙළ ගැසීම:</u>

ගිහි පැවිදි සියලුම උපාධිලාභීන් පෙරහැරේ ගමන් කළ යුතු අතර, ගිහි උපාධිලාභීන් උපාධි ලෝගුව හා හිස්වැස්ම පැළඳ සිටීම අනිවාර්ය වේ. උපාධිලාභීන් පෙරහැරේ ගමන් කළ යුත්තේ උපාධිලාභී නාමලේඛනයේ සඳහන් අනුපිළිවෙලට බැවින් ඔබට ලබා දී ඇති පෙරහැර අංකයේ පිළිවෙලට පෙළ ගැසිය යුතුය. <u>උපාධි සාටකය පැළඳ ගැනීම සිදුකළ යුත්තේ උපාධිය පිරිනැමීම සඳහා ඔබ වේදිකාවට පිවිසෙන අවස්ථාවේදී පමණක් බව කරුණාවෙන් සලකන්න. ඉන් පසුව උපාධි ප්‍රදානෝත්සවය අවසන් වන තෙක් එය පැළඳ සිටිය යුතුය.</u>

6. **<u>පෙරහැර අංක පැළඳ සිටීම:</u>**

ඔබගේ උපාධි සහතිකය වෙනත් උපාධිලාභියකු වෙත නිකුත් වීම වැලැක්වීම සඳහා ඔබගේ පෙරහැර අංකය උපාධි ලෝගුවේ අලවනු ලැබේ. ඔබ ප්‍රධාන වේදිකාවට ප්‍රවිශ්ය වන අවස්ථාවේ දී එම පෙරහැර අංකය උපාධි සාටකයෙන් නොවැසෙන පරිදි තබා ගත යුතු අතර, එය ඉතා ප්‍රවේශමෙන් උපාධි ලෝගුවෙන් නොගැලවෙන සේ තබා ගැනීමට ඔබ විසින් වගබලා ගත යුතුය.

7. **<u>වේදිකාව තුල දී උපාධි සහතිකය ලබා ගැනීම:</u>**

උපාධි ප්‍රදානෝත්සවය ආරම්භ කිරීමෙන් පසුව, උපාධිලාභීන්ගේ නම් ප්‍රකාශ වන අනුපිළිවෙලට වේදිකාවට කැඳවා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපති ස්වාමීන්ද්‍රයන් වහන්සේ හෝ උපකුලපතිතුමා විසින් ඔබ වෙත උපාධිය ප්‍රදානය කරනු ලැබේ.

8. **<u>ප්‍රවේශ පත්‍ර:</u>**

උපාධිලාභියෙකුට බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට ඇතුල්විය හැක්කේ නිකුත් කර ඇති ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කරන්නේ නම් පමණි. මේ සඳහා ඔබට එක් ප්‍රවේශ පත්‍රයක් ද, ඔබගේ දෙමව්පියන් හෝ වෙනත් අමුත්තන් සඳහා ප්‍රවේශ පත්‍ර දෙකක් ද නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශ පත්‍ර ද උපාධි ලෝගුව, සාටකය සහ හිස්වැස්ම සමඟ නිකුත් කිරීමට කටයුතු කරනු ලබන අතර, වාහන ප්‍රවේශ පත්‍රය ද ඒ සමඟම නිකුත් කරනු ලැබේ. වයස අවුරුදු <u>18 ට</u> අඩු කිසිම අයෙකුට මෙම ප්‍රවේශපත් වලින් ශාලාවට පිවිසීමට අවසර දෙනු නොලැබේ.

9. **<u>උපාධි පිරිනැමීම නිමාව:</u>**

එක් සැසියක් අවසානයේ සංග්‍රහයක් පැවැත්වෙන අතර, ඊට අදාළ අවසර පත්‍ර ඔබගේ ප්‍රවේශ පත්‍රය සමඟ ඇත. ඔබට නියමිත සැසිය අවසන් වූ වහාම ඊළඟ සැසිය සඳහා උපාධිලාභින්ගේ පෙරහැර හා ආචාර්ය මණ්ඩලයේ පෙරහැර සංවිධානය කිරීමට කටයුතු කරනු ලබන බැවින්, ඒ සඳහා බාධාවක් නොවන පරිදි ප්‍රධාන පරිශ්‍රයෙන් හා පෙරහැර පෙළ ගැසෙන ස්ථානයෙන් ඉවත් වී ඔබගේ සහයෝගය දක්වන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

10. **<u>ඡායාරූප ලබා ගැනීම</u>**

ඡායාරූප ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාලය මගින් නිල ඡායාරූප ආයතනයක් තෝරා ගනු ලැබේ. විශ්වවිද්‍යාල නිල ලාංඡනය සහිතව ඡායාරූප නිකුත් කළ හැකි වනුයේ එම ආයතනයට පමණි. විශ්වවිද්‍යාලය මගින් අනුමත ඡායාරූපවල ප්‍රමාණයන් හා මිල ගණන් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය මගින් පසුව දැනුවත් කරනු ලැබේ. ඡායාරූප ලබා ගැනීම සඳහා අදාළ ආයතනය වෙත අත්තිකාරම් ගෙවීම උපාධි ලෝගුව ලබා ගන්නා අවස්ථාවේදී කළ හැකිය. ඡායාරූප ලබා ගැනීම සඳහා වැඩි විස්තර උපාධි ලෝගුව ලබා ගන්නා අවස්ථාවේදී අදාළ ආයතනයේ නියෝජිතයන්ගෙන් ලබාගත හැකිය.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
අධ්‍යයන ශිෂ්‍ය කටයුතු, ප්‍රකාශන හා විභාග අංශය
ලේඛකාධිකාරී වෙනුවට

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
අධ්‍යයන ශිෂ්‍ය කටයුතු, ප්‍රකාශන හා විභාග අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ.

**සැලකිය යුතුයි.**

- **ඔබ සහ ඔබ සමඟ පැමිණෙන අමුත්තන් විසින් කැමරා සහ ජංගම දුරකථන යනාදිය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව තුළට රැගෙන යාම ආරක්ෂක හේතූන් මත තහනම් කර ඇති බැවින්, ඒවා රැගෙන ඒමෙන් වැළකිය යුතුය.**